# INTERNATIONAL TRADE (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# වෙළෙඳ අනුපාතය

අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස අර්ථ දැක්විය හැකි ය.

වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දෙකකි.

1. **භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය**
2. **ආදායම් වෙළෙඳ අනුපාතිකය**

ClassWork.LK

# භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ලෙසින් අර්ථ දක්වන්නේ ද අපනයන ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය ලෙස දැක්වූ වෙළෙඳ අනුපාතය ම ය.

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහත සඳහන් පරිදි සමීකරණයක් ඇසුරින් දැක්විය හැකි ය.

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

## නිදසුන 1

2022 වර්ෂයේ අපනයන මිල දර්ශකය = 103.5

2022 වර්ෂයේ ආනයන මිල දර්ශකය = 108.4

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතය} = \frac{103.5}{108.4} \times 100$$

භාණ්ඩ වෙළෙඳ අනුපාතය = 95.47%

ClassWork.LK

# භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි ය.

| **භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු** | **භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වැඩි වීම කෙරෙහි බලපාන හේතු** |
|---|---|
| අපනයන මිල දර්ශකය පහත වැටී ආනයන මිල දර්ශකය ඉහළ යාම | අපනයන මිල දර්ශකය ඉහළ හා ආනයන මිල දර්ශකය පහළ යාම |
| ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය පහළ බැසීම | අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය පහත වැටීම |
| අපනයන මිල දර්ශක ය ස්ථාවර ව තිබිය දී ආනයන මිල දර්ශකය ඉහළ යාම | අපනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී ආනයන මිල දර්ශකය පහළ යාම |
| ආනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී අපනයන මිල දර්ශකය පහත වැටීම | ආනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී දී අපනයන මිල දර්ශකය ඉහළ යාම |

ClassWork.Lk

පසුගිය වසර කිහිපය තුළ භාණ්ඩ වෙළෙඳ අනුපාතය වෙනස් වී ඇති ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.

| වර්ෂය | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය | භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය |
|---|---|---|---|
| 2010 | 100 | 100 | 100.0 |
| 2011 | 106.3 | 102.5 | 100.2 |
| 2012 | 105.2 | 103.51 | 99.6 |
| 2013 | 105.5 | 108.51 | 97.6 |
| 2014 | 105.5 | 108.51 | 97.6 |
| 2015 | 95.6 | 95.3 | 100.3 |
| 2016 | 94.1 | 90.35 | 104.0 |
| 2017 | 95.1 | 91.35 | 102.0 |

ClassWork.LK

# භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස්වීම්වල ආර්ථික ප්‍රතිවිපාක

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස්වීම්වල ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

## භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- එම අපනයනවල ආනයන ශක්‍යතාව ඉහළ යාම
- වෙළෙඳ ශේෂය වාසිදායක වීම
- සමස්ත ශේෂයට (ගෙවුම් ශේෂයට) වාසිදායක වීම
- සංචිත හා වත්කම් ඉහළ යාම

ClassWork.LK

## භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- අපනයන හා ආනයන ශක්‍යතාව පහළ යාම
- වෙළෙඳ ශේෂ හිඟය වැඩි වීම
- ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය වැඩි වීම
- සංචිත හා වත්කම් අඩු වීම

ClassWork.LK

# ආදායම් වෙළෙඳ අනුපාතිකය

ආදායම් වෙළෙඳ අනුපාතිකය යනු අපනයන ආදායමෙහි ආනයන ක්‍රය ශක්තිය මැනීම සඳහා භාවිත කරන දර්ශකය යි.

ආදායම් වෙළෙඳ අනුපාතිකය මැනීම සඳහා පහත සඳහන් සමීකරණය යොදා ගනී.

$$\text{ආදායම් වෙළෙඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය x අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

**නිදසුන :**

2022 වර්ෂයේ අපනයන මිල දර්ශකය = 103.5

2022 වර්ෂයේ ආනයන මිල දර්ශකය = 108.4

2022 වර්ෂයේ අපනයන පරිමා දර්ශකය = 116.4

2022 ආදායම් වෙළෙඳ අනුපාතිකය $\frac{103.5 \times 116.4}{108.4} \times 100$

2022 වර්ෂයේ ආනයන මිල දර්ශකය = 11113.8

භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අපනයන පරිමා දර්ශකයෙන් ගුණ කිරීමෙන් ද ආදායම් වෙළෙඳ අනුපාතිකය ලබා ගත හැකි ය.

ClassWork.LK

# ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක

ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි ය.

| ආදායම් වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක | ආදායම් වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක |
|---|---|
| අපනයන ඉපයුම් වැඩි වීම | ආනයන වියදම් ඉහළ යාම |
| අපනයන ශක්‍යතාව ඉහළ යාම | ආනයන ශක්‍යතාව පහළ යාම |
| වෙළෙඳ ශේෂය ඉහළ යාම | වෙළෙඳ ශේෂය පහළ යාම |
| ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය හිතකර තත්ත්වයකට පැමිණීම | ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අහිතකර තත්ත්වයකට පැමිණීම |
| උද්ධමනාත්මක බලපෑම් ඇති කිරීම | උද්ධමනාත්මක බලපෑම් අඩු වීම |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura